## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.
## කෑගල්ල දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 11 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු වටිනාකම රු. 444,304 ක් වූ වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වර්ෂය තුල මිළදී ගෙන ඇති වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ඉදිරියට එමින් පවතින අවිනිශ්චිත ගිණුමේ ශේෂය වූ රු.327,347 ක් හේතු සොයා තහවුරු කර ගැනීමකින් තොරව සමුච්චිත අරමුදල මඟින් කපා හැර තිබුණි. | හඳුනාගෙන ගිණුම් වලට ගලපා නිවැරදි කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා මාසිකව පිළියෙල කරන ලද ආදායම් හා වියදම් විශ්ලේෂණ අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 908,929 ක් හා රු. 1,665,795 ක් වුවද ලෙජරයේ එය පිළිවෙලින් රු. 1,574,254 ක් හා රු.1,577,543 ක් ලෙස සටහන් කිරීම නිසා අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 753,577 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ වැය විශ්ලේෂණය අනුව ණයහිමි ගෙවීම රු.13,263,183 ක් වුවද ලෙජරයේ එය රු.13,351,543 ක් ලෙස සටහන් කිරීම නිසා ණයහිමි ශේෂය රු.88,360 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ණයහිමි ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දෛනික ආදායම් සාරාංශ ලේඛණය අනුව සමුච්චිත අරමුදල සඳහා ලැබීම් රු. 167,719 ක් වුවද, ලෙජරයේ එය රු. 2,691,008 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කළ යුතුය. | විගණනයෙන් මුදල දන්වා නොමැති බැවින් ණය හිමි වෙන්කල නොහැකි බවත්, අයවැය මගින් විගණන ගාස්තු වෙන්කර ඇති බැවින් ගෙවීම් කටයුතු කල හැකි බව දන්වමි. |
| (උ) | සේවක ණය බැංකු ගිණුම අනුව සමාලෝචිත වර්ෂය තුල ණය ගෙවීම් රු. 7,263,710 ක් වුවද, ණය ගිණුමේ එය රු. 7,624,904 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 361,194 ක වෙනසක් පැවතුණි. එමෙන්ම එම රු.7,624,904 ක මුදල සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබීමෙන් සමුච්චිත අරමුදලේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඌ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන 13 අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වගකීම් රු.59,689,780 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල එය රු. 62,279,780 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වගකීම් රු. 2,590,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වෙනසට හේතු සොයා ගැලපීම් කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 10 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.3,388,918 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන අදාල ලේඛන හා උපලේඛන සමඟ සසඳා නිවැරදි කරගත යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඒ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව විෂයන් 05 ක එකතු වටිනාකම රු.128,443,354 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු. 131,890,409 ක් වූයෙන් රු. 3,447,055 ක වෙනසක් පැවතුණි. | සමීක්ෂණ වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන සසඳා වෙනස්කම් සොයා ගෙන නිවැරදි කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම් රු.879,168 ක් ලෙස ගිණුම්ගත කර තිබුණද, පුස්තකාල මගින් ඉදිරිපත් කර තිබූ උපලේඛණ අනුව මිලදී ගැනීම් හා පරිත්‍යාග රු.491,998 ක් වූයෙන් රු. 387,170 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන අදාල ලේඛන හා උපලේඛන සමඟ සසඳා නිවැරදිකර ගත යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | ප්‍රාග්ධනයෙන් ආදායමට දායකවීමේ ගිණුම හා ස්ථාවර වත්කම් එකතු වටිනාකම අතර රු. 167,760 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල රු.1,900,227 ක් වූ ආපසු නොගෙවූ තැන්පත්, විවිධ තැන්පත් හා ටෙන්ඩර් ඇප සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. | 2020 වර්ෂය අවසානයේ රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,519,782 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,478,780 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු ගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළුහිඟ ආදායම | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ආදායම |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 6,222,042 | 5.880,164 | 5,326,792 | 3,531,435 | 3,187,000 | 4,259,303 | 3,102,285 | 1,157,018 |
| (ii) | කුලී | 16.506,032 | 16,002,053 | 14,302,363 | 7,103,965 | 9,041,200 | 12,339,336 | 8,574,231 | 3,765,105 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 795.100 | 848,449 | 848,449 | 29,745 | 610,100 | 677,460 | 677,460 | - |
| (iv) | වෙනත් ආදායම් | 21.111,000 | 21,641,566 | 37,430,077 | 35,637,169 | 72,954,800 | 66,077,240 | 45,929,762 | 20,147,480 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|

**(අ) වරිපනම් බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.3,468,458 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 02 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. 836,576 ක් පැවතුණි. හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ කපාහැරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත බවත් අනෙකුත් හිඟ අය කිරීම සඳහා දේපල තහනම් කිරීම් සහ ජංගම සේවාවන් ක්‍රියාත්මක කරන බවත් දන්වමි. |

**(ආ) අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ අක්කර බදු ශේෂය රු. 62,977 ක් වූ අතර ඒ තුල වසර 05 ට වැඩි කාලයක සිට පැවත එන රු.55,862 ක් ඇතුලත් වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වසර 05 ට වැඩි කාලයක සිට පැවත එන හිඟ අක්කර බදු අය කර ගැනිම සඳහා ආදායම් පරික්ෂක මහතුන්ට භාර දී ඇති බව දන්වමි. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට පොදු වැසිකිළි කුලී සහ මස්කඩ, මාළුකඩ කුලී හා දඩ ශේෂය රු. 1,719,052 ක් වූ අතර ඒ තුල වසර 04 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.861,538 ක් ඇතුලත් වී තිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම්ගත විධිවිධාන අනුගමනය කළ යුතුය. | පොදු වැසිකිළි, මස්කඩ හා මාළුකඩ හිඟ අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 6,735,590 ක් විය. | ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. | ලැබිය යුතු උසාවි දඩ මුදල ගෙන්වා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | කසළ අංගනය තුල පොහොර නිෂ්පාදනය කර ඉතිරිවන නොදිරන ද්‍රව්‍ය පෞද්ගලික ඉඩමකට බැහැර කිරීමට කටයුතු කර තිබුණු අතර සනීපාරක්ෂක බිම් පිරවුමක් සඳහා ඉඩමක් පවරා ගෙන ඇති නමුදු ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනාවක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම පමණක් සිදුකර තිබුණි. | මධ්‍යම පරිසර අධිකාරිය විමසා මේ සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. | සනීපාරක්ෂක බිම් පිරවුමක් සඳහා ඉඩමක් පවරාගෙන ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනාවක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කලද ඒ සඳහා ප්‍රතිචාරයක් දක්වා නොමැත. |
| (ආ) | කසළ අංගනය සඳහා ස්ථිර ජල සැපයුමක් නොතිබුණු අතර, 2014 වර්ෂයේ සවිකරන ලද හලර් යන්ත්‍රයක් තෙකලා විදුලිය නොමැති බැවින් නිෂ්කාර්යව පැවතුණි. එමෙන්ම මල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියේ වැඩ අවසන්ව නොතිබීම හේතුවෙන් අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් නොමැති පාරිභෝගිකයින් වෙත ගලි සේවාව ලබාදීමට නොහැකි වී තිබුණි. | හලර් යන්ත්‍රය නිෂ්පාදනය සඳහා යොදා ගැනීමටත්, මල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම කඩිනම් කිරීමත් කළ යුතුය. | ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය අසල මල ප්‍රතිචක්‍රීකරන ව්‍යාපෘතිය ඉදිවෙමින් පවතින බැවින් බැහැර කරනු ලබන ජලය කසළ අංගනය සඳහා යොදාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බවත් ගලි බැහැර කිරීමට ස්ථානයක් ඇති අයවලුන් සඳහා ගලි සේවාව අඛණ්ඩව ලබාදෙන බව දන්වමි. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂය රු. 59,689,780 ක් වූ අතර මෙයින් වසර 02 ඉක්ම වූ ණයහිමි ශේෂය රු. 15,433,989 ක් වුවද මේ දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පැරණි ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම වර්ෂය අවසානයට පෙර ණය හිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු වර්ග 10 ක සේවක පුරප්පාඩු 17 ක් වූ අතර තනතුරු වර්ග 05 ක අතිරික්තය 23 ක් විය. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමද අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හෝ කාර්ය මණ්ඩල සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයට ප්‍රධාන වශයෙන් බලපාන ලේකම් තනතුර 2011 මාර්තු 31 සිටද, සැලසුම් ශිල්පී තනතුර 2015 සැප්තැම්බර් 23 සිටද, පුස්තකාලයාධිපති තනතුර 2013 ජනවාරි 01 දින සිට හා පොදු වෙළඳසැල් පරිපාලක තනතුර 2018 මාර්තු 01 දින සිට ද පුරප්පාඩුව පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. | ලේකම්ධුරය සඳහා වැඩ බැලීමේ පදනම මත කළමනාකරණ සේවා නිළධාරිනියක් පත්කර ඇති බවත් අනෙක් තනතුරු සඳහා සේවා ගිවිසුම් මත හෝ බඳවාගෙන නොමැති බව දන්වමි. |
| (ඇ) | ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සේවකයින් 06 දෙනකුගෙන් 2002 පෙබරවාරි සිට 2013 වසර දක්වා අයවිය යුතු සේවක ණය රු. 80,150 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.3, 4.4, 4.5 සහ 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එක් සේවකයකු සඳහා තොරතුරු පරීක්ෂා කිරීමට කාලයක් අවශ්‍ය බවත්, තව සේවකයකු සඳහා තොරතුරු සොයාගත නොහැකි බවත්, ඉතිරි සේවකයන් සඳහා ඉදිරියේදී අයකර ගැනීමට නීතිමය කටයුතු ක්‍රියාත්මක කරමින් පවතින බවත් දන්වමි. |

## 3.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සභාපතිවරයාට පළාත් පාලන බල ප්‍රදේශයෙන් පිට රාජකාරී සඳහා පමණක් සංයුක්ත දීමනා ගෙවිය හැකි වුවත් ඒ බව තහවුරු කරගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ජූනි, අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස වලට අදාලව දින 120 ක් සඳහා රු. 120,000 ක සංයුක්ත දීමනා ගෙවා තිබූ අතර ඒ තුළ කාර්යාලයේ සේවය කළ දිනයන්ද ඇතුලත්ව තිබුණි. | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව සංයුක්ත දීමනා ගෙවිය යුතුය. | සභාපතිවරයා කාර්යාලයේ රැඳී සිටි දින කීපයක් වෙනුවෙන් ගමන් වියදම් ගෙවා ඇති බවත් මෙම වරද ඉදිරියට සිදුනොවීමට කටයුතු කරන බවත් අඩුපාඩු ඇති නොවන පරිදි ධාවන සටහන් ලිවීමට අදාල රියදුරු මහතා වෙත උපදෙස් ලබාදී ඇති බවත් දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී ඉදි කරන ලද නව සතිපොළ කඩ හිමියන් වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි. | නව සතිපොල විවෘත කිරීමට කටයුතු කළ යුතුය. | නව සතිපොළ මැතිවරණය නිමවූ විගස විවෘත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |

### 3.5.2 වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| පළාත් පාලන චක්‍රලේඛ අංක 08/2010 – 07 වගන්තිය අනුව සුසාන භූමිවල අයිතිය, පැවැත්ම, ආරක්ෂාව, නඩත්තුව, හා පාලනය විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි කාලය තුළ සුසාන භූමි සම්බන්ධව ක්‍රමවත් වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |

**3.5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. | 2020 වර්ෂයේ නිවැරදි කර ගැනීමට කටයුතු කල බව දන්වමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 18 ක රු.82,086,939 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමටත්, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කල යුතුය. | ඉදිරි වර්ෂයේ අයවැය සකස් කිරීමේදී මෙවැනි ශීර්ෂ කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. |

**4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සියළුම අතුරු අග්‍රිම අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් 2001 වර්ෂයට පෙර සිට ගිණුම් මගින් ඉදිරියට ගෙන එන රු. 625,651 ක් හා 2014 හා 2018 වර්ෂ අතර කාලය තුල නොපියවූ රු. 187,889 ක්වූ අත්තිකාරම් 2020 ජූනි දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | 2001 වර්ෂයට පෙර සිට ගිණුම් මගින් ගෙන එන රු. 625,651 ක මුදල ලේඛන වලින් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇති බව දන්වමි. |